සැ. යු.- 2013.08.30 දින පළ වූ අංක 1,826 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,827 - 2013 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා - 2013.09.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1782 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1790 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1795 |


*සැ. යු.-* (i) විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 ජූලි මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වල්පොල පියානන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 අගෝස්තු මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 සැප්තැම්බර් මස 27 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 සැප්තැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## කැලණිය ප්‍රාදේශීය සභාව

කැලණිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබූ 2013.03.01 වැනි දින ගැසට් නිවේදනය මෙසේ සංශෝධනය විය යුතුය.

ඉහත ගැසට් නිවේදනයේ සෞඛ්‍ය කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව 09 ලෙස සඳහන් වුවද එම සංඛ්‍යාව 13 ලෙස සංශෝධනය විය යුතුය.

එච්. එම්. නෙළුම් කුමාරි,
ලේකම්,
කැලණිය ප්‍රාදේශීය සභාව.

2013 අගෝස්තු මස 21 වැනි දින,
කැලණිය ප්‍රාදේශීය සභාවේ දී ය.

09-44

---

## මහරගම නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත දැක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| 1. *තනතුර හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| (i) වෙළඳ සැල් පරිපාලක II<br>මාසික : රු.13,120 - 10 x 145 - 11 x 170<br>10 x 240 - 10 x 320 - රු.22,040- (MN 1-2006-A)<br>(හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) - තනතුරු 01 | (අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබිය යුතුය.<br>*සහ*<br>(ආ) මනා පෞරුෂයකින් යුක්ත විය යුතු අතර, සිංහල හා දෙමළ භාෂාවලින් කථා කිරීමේ හැකියාව තිබිය යුතුය. |
| (ii) වැඩ/ක්ෂේත්‍ර පරිපාලක II<br>මාසික : රු.13,120 - 10 x 145 - 11 x 170<br>10x 240 - 10 x 320 - රු. 22,040 (MN1-2006A)<br>(හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) - තනතුරු 02 | (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය/ගණිතය/ වානිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම<br>*හෝ*<br>(ආ) ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම<br>*හෝ*<br>(ඇ) පළාත් පාලන ආයතනයක අවුරුදු 10 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 8 වැනි ශ්‍රේණිය සමත් වී තිබීම. |

*2. බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණය,

(අ) සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක්,

හා

(ආ) සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයක්

*සම්මුඛ පරීක්ෂණය.-* රා. ප. ච. 15/90 ප්‍රකාර ලිඛිත පරීක්ෂණයක් මගින් තීරණය වන කුසලතාවය මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*3. යන්ත්‍ර ක්‍රියාකරු*

(i) බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු
මාසික ෑ රු. 12,210 - 10 x 130 - 10 x 145
10 x 160 - 12 x 170 - රු. 18,600
(රා.ප.ච. 6/2006 iv හි (PL-2- 2006-A)
වැටුප් පරිමාණයේ 12 වන පියවර
ආරම්භක වැටුප් වේ) හතරවන වැටුප්
පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ
ඉමකි. - තනතුරු 02

( I) *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඃ-*

*(අ)* අවම වශයෙන් 08 වන ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම

(II) *බාහිර අයදුම්කරුවන් සඳහා ඃ-*

*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් 02 ක් සමත් වී තිබීම

(III) *වෘත්තීය හා වෙනත් සුදුසුකම්*

*(අ)* තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32 ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

*(ආ)* අවම උස අඩි 5 අඟල් 6 ක් විය යුතුය.
*(ඇ)* බර යන්ත්‍ර ක්‍රියා කරවීම පිළිබඳව, රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීනතාවයක් ලබා තිබීම.
*(ඈ)* මෝටර් යන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතු ය.

.

(ii) මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර ක්‍රියාකරු
මාසික ෑ රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 -
12 x 170 - රු.18,600 (රා. ප. ච. 6/2006 iv හි (PL-2- 2006-A)
වැටුප් පරිමාණයේ 12 වන පියවර ආරම්භක වැටුප වේ)
හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා
කඩ ඉමකි. - තනතුරු 01

එම.

*බඳවා ගැනීමේ ක්‍රමය ඃ*

මාර්ග නීති පිළිබඳව දැනුමක් ඇති රථවාහන පොලීසියේ හෝ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයේ නිලධාරියෙකු, බර යන්ත්‍රෝපකරණ පිළිබඳ හා මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳව ප්‍රවිනතාවයක් ඇති මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හා නගර සභාවේ එක් මාණ්ඩලික නිලධාරියෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුනත්වය මැනීමේ පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතුය.

.4. විදුලි කාර්මික III රු. 12,210 - 10 x 130 - 10 x 145 -
10 x 160 - 12 x 170 - රු. 18,600 (PL- 2-2006A)
හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා
කඩ ඉමකි. - තනතුරු 01

*(I) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඃ-*

*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී, කුමන හෝ විෂයයන් 6 ක් සමත් වී තිබීම. මින් විෂයන් 5ක් එකවරකදී සමත් වී තිබිය යුතුය.

*සහ*

*(ආ)* තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය)

*(II) බාහිර අයදුම්කරුවන් සඳහා ඃ-*

*(අ)* ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.

*සහ*

*(ආ)* තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතුය)

*(III) වෘත්තීය සුදුසුකම් ඃ-*

*(අ)* වෘත්තියට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම;

*හෝ*

(ආ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම ;

හෝ

(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(ඈ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(ඊ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව, එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

5. මෝටර් කාර්මික (මිකැනික්) රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 (PL 2-2006A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. තනතුරු 01

- එම -

6. පැස්සුම්කරු III රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 (PL2-2006A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි. තනතුරු 01

- එම -

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

*ලිඛිත පරීක්ෂණය :*

*(අ)* තනතුරට අදාලව න්‍යායාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා පැය 1 ක බහුවරණ ප්‍රශ්න පත්‍රයක් ;

*ප්‍රායෝගික පරීක්ෂණය :-*

(ආ) තනතුරට අදාලව පවත්වනු ලබන පැය 1/2 ක ප්‍රායෝගික පරීක්ෂණයක්

තනතුරට අදාල තාක්ෂණික දැනුමක් ඇති ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු, පරිපාලනය සම්බන්ධ මාණ්ඩලික නිලධාරියකු සහ නගර සභාවේ එක් මාණ්ඩලික නිලධාරියකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ දෙකෙන් ලබා ගන්නා කුසලතාවයන් මත සුදුස්සසන් බඳවා ගැනේ.

7. ආදාහනාගාර ක්‍රියාකරු III රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,600 (PL-2-2006A) (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.) තනතුරු 08

*1. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*

(අ) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම; සහ

(ආ) තනතුරට අදාලව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.)

*11. බාහිර අයදුම්කරුවන් සඳහා :*

(අ) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී, කුමන හෝ විෂයයන් දෙකක් සමත්වී තිබීම;

සහ

(ආ) තනතුරට අදාළව අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම. (රජයේ ලියාපදිංචි ආයතනයක සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)

*බඳවා ගැනීමේ ක්‍රමය :*
තාක්ෂණික දැනුමක් ඇති මාණ්ඩලික නිලධාරියකු, පරිපාලනය සම්බන්ධ මාණ්ඩලික නිලධාරියකු සහ පත්වීම් බලධාරියා හෝ ඔහුගේ නියෝජිතයකු සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන තාක්ෂණික නිපුනතාවය/ශිල්පීය හැකියාව මැන බැලීමේ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

8. ආදාහනාගාර ක්‍රියාකරු සහායක III
මාසික : රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600
(PL-1-2006-A) හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.
තනතුරු 8

*(අ)* අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම.

9. මුරකරු II
මාසික : රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 = රු.17,600 (රා.ප.ච. 6/2006 iv හි (PL-1-2006-A) වැටුප් පරිමාණයේ 12 වන පියවර ආරම්භක වැටුප වේ) හත්වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.
තනතුරු 1

I. *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -*

*(අ)* අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබීම.

*(ආ)* කාර්යාල සේවක සේවයේ III පංතියේ තනතුරක ස්ථිර කර තිබීම සහ වසර 06 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

*(ඇ)* III පංතියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

*(ඈ)* පූර්වාසන්න වසර 5 ක කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම.

II. *බාහිර අයදුම්කරුවන් සඳහා -*

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතු ය.

*02. පොදු සුදුසුකම් :-*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.
(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය.
(iv) අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවු : 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ)

0.3 *බඳවා ගැනීමේ ක්‍රමය.-* රා. ප. චක්‍රලේඛ 24/95 විධිවිධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසි වලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලට ද, මහරගම නගර සභාව විසින් වරින් වරට නිකුත් කරන ලද/ලබන නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය.
(iv) බඳවා ගනු ලබන සේවකයින් අංක 7/2007 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාළ භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

05 *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2013.09.25 වැනි දිනට පෙර "ලේකම් මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය) නියමිත දින පසුවී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

යූ. ඩී. සී. ප්‍රනාන්දු,
ලේකම්,
මහරගම නගර සභාව.

2013 අගෝස්තු මස 15 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම් පත්‍රය*

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම***
***මහරගම නගර සභාව***
***....................................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————————.
 මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.
02. ස්ථිර ලිපිනය:——————————.
03 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
04 දුරකථන අංකය:——————————.
05 ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
06. උපන් දිනය : අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.
07. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු:——————. මාස:——————. දින:——————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
09. විවාහක/අවිවාහක බව:——————————.
10. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචියෙන් ද යන වග:——————————.
11. අධ්‍යාපන සුදුසුකම් : (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය):——————————.

(1) අ.පො.ස (සා. පෙළ) විභාගය :
 සමත් වර්ෂය හා විභාග අංකය :——————.

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | ——————. | ——————. | 6. | ——————. | ——————. |
| 2. | ——————. | ——————. | 7. | ——————. | ——————. |
| 3. | ——————. | ——————. | 8. | ——————. | ——————. |
| 4. | ——————. | ——————. | 9. | ——————. | ——————. |
| 5. | ——————. | ——————. | 10 | ——————. | ——————. |

(ii) අවසන් වරට සමත් වූ ශ්‍රේණිය

12. *වෙනත් සුදුසුකම්* :——————.
13. සේවා පළපුරුද්ද:——————.

 13. 1 දැනට සේවය කරන ආයතනය :——————.
 13 2 දැනට දරන තනතුර :——————.
 13. 3 එම තනතුරට පත් වූ දිනය:——————.
 13. 4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර ::——————.

14. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳ කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම ඉල්ලුම්කරු වන ............................... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ............................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකුල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————.
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ හෝ
බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය :——————————.
පදවි නාමය හා ආයතනය :——————————.

09-46

## අගලවත්ත ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම් තාවකාලික ආදේශක සේවකයින් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ ක්ෂේත්‍ර කම්කරු III | 01 | PL -1- 2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වැනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය. |
| 02 | පුස්තකාල සේවක | 01 | PL-1- 2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා/පෙළ විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයන් 06 ක් සමත් විය යුතුය. |
| 03 | යන්ත්‍ර ක්‍රියාකරු මෝටර් ග්‍රේඩරය | 01 | PL- 2 - 2006A<br>රු.12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,600 | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br>අවම වශයෙන් 8 ශ්‍රේණිය 9 වසර සමත් විය යුතුය.<br>*බාහිර අයදුම්කරුවන් සඳහා -*<br>ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී කුමන හෝ විෂයන් දෙකක් සමත් වී තිබීම.<br>*වෘත්තීය හා වෙනත් සුදුසුකම් -*<br>(i) තාර බර හොන්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් හා මගීන් 32 ට වඩා ගෙනයාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.<br>(ii) අවම උස අඩි 5 අඟල් 6 ක් විය යුතුය.<br>(iii) බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව, රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීනතාවයක් ලබා තිබීම. (පිළිගත් ආයතනය වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක්, අර්ධ රාජ්‍ය ආයතනයක්, පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ.)<br>(iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 04 | රියදුරු | 01 | PL-3-2006A 1- රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | අවම වශයෙන් 8 ශ්‍රේණිය - 9 ශ්‍රේණිය සමත් විය යුතුය.<br>*වෘත්තීය හා වෙනත් සුදුසුකම්*<br>(අ) පෞද්ගලික - කුලී රථ හා තාර බර හොන්ඩර් 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුයි.<br>(ආ) රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් පසුව රියදුරකු වශයෙන් වසර 3 ක පලපුරුද්දක් තිබිය යුතු අතර සහතික මගින් සනාථ කළ යුතුයි.<br>(ඇ) අවම වශයෙන් උස අඩි 5 ක් විය යුතුය.<br>(ඈ) දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br>(ඉ) මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. |

*02. අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුයි.
(iii) අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුයි.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් හා දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් හා වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2013.09.20 හෝ එදිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, අගලවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ අදාල තනතුර සඳහන් කර "........................................... තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.
(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) පාසලෙන් අස්වීමේ සහතිකය;
(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුයි);
(ඉ) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්;
(ඊ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. ආර්. පොතුවිල,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2013 අගෝස්තු මස 19 වැනි දින,
අගලවත්ත,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

අගලවත්ත ප්‍රාදේශීය සභාව

**අගලවත්ත ප්‍රාදේශීය සභාවේ................තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————.
3. ස්ථිර ලිපිනය :——————————————.
4. ග්‍රාම නිලධාරී කොට්ඨාසය :——————————————.
5. දිස්ත්‍රික්කය :——————————————.
6. උපන් දිනය ඃ අවුරුද්ද:——————————. මාසය:——————————. දිනය:——————————.
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය (2013.09.20) වයස ඃ අවුරුදු :——————————.මාස:——————————. දින:——————————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————————.
9. විවාහකද/අවිවාහක ද යන වග :——————————————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද, එසේ නම් පරම්පරාවෙන්ද ලියාපදිංචි වීමෙන්ද යන වග :——————————————.
11. ජාතික හැඳුනුම්පත් අංකය:——————————————.
12. අධ්‍යාපන සුදුසුකම් ඃ
    අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය ඃ

| *අනු අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

13. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————————.

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :——————————.
    එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග)

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද දනිමි.

——————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

........................................................ මහතා/මහත්මිය මෙම ආයතනයේ ..........................................................................වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

09-80

# පළාත් පාලන නිවේදන

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහාද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයක් වේ නම් මෙම දැන්වීම පලකල දින සිට මාස 03ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එම්. උපාලි දිසානායක,<br>
සභාපති,<br>
කෑගල්ල ප්‍රාදේශීය සභාව,<br>
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

### උපලේඛනය

01. නාගොල්ල පුවක්දෙණිය ගම් සභා මාර්ගයට සම්බන්ධ වන ගුණසේකර මාවත
දිග : අඩි 957
පළල : අඩි 10

**පාරේ වම් පස**

1. එම්. ඩබ්. ආනන්ද සිරිපාල
2. බී. එම්. ඩී. ප්‍රේමරත්න
3. ජී. ආර්. රත්නායක
4. එච්. ඩබ්. වි. ප්‍රියන්ත මහීලාල්
5. එස්. ඒ. ටී. කුමාරි
6. එච්. ජේ. ආර්. හිටිහාමු

} වැරැල්ලේහේන වත්ත හපුගහමුලවත්ත

7. පී. ඩබ්. නන්දාවති මැණිකේ
8. ඒ. දයානන්ද රාජා
9. ඩබ්. ඩබ්. ජයතිලක බණ්ඩාර
10. ආර්. ඒ. නිහාල් රණසිංහ
11. එල්. ආර්. චමින්ද සම්පත් ගුණසේකර
12. එල්. ආර්. ගුණසේකර
13. එල්. ආර්. නුවන් බද්ධික ගුණසේකර


} වැරැල්ලේහේන වත්ත

14. බී. ඒ. රංමැණිකේ
15. ඒ. ඒ. මල්ලාකා කුමාරි අතාවුද

} බෝගහමුලහේන


**පාරේ දකුණු පස**

1. එච්. දයානන්ද - වැරැල්ලේහේන වත්ත
2. එස්. එන්. රාජකරුණා - වැරැල්ලේහේන
3. කේ. කේ රත්නායක - වැරැල්ලේහේන
4. එල්. ආර්. ගුණසේකර - වැරැල්ලේහේන වත්ත




2.55ඩී මීදෙණිය දකුණ වසම විහාර මාවත සිට වතුරවත්ත සහ අඹතැන්න වත්තට යන මාර්ගය නිවැල්ල සිට අඹතැන්න දක්වා පාර
දිග : මීටර් 180
පළල : මීටර් 2.5

| *පාරේ වම් පස* | *පාරේ දකුණු පස* |
|---|---|
| ඩබ්. යූ. දර්ශන බණ්ඩාර වගුරේ වත්ත | 1. එස්. ඒ. ජයතිලක බණ්ඩාර - වතුරේ වත්ත |
| | 2. එස්. ඒ. විමලාවත් - වතුරේ වත්ත |
| | 3. එස්. ඒ. කරුණාතිලක - වතුරේ වත්ත |
| | 4. කේ. ඒ. යසරත්න - ලමිදුගේ හේන |
| | 5. එම්. හීනටිගල - අඹතැන්න හේන |
| | 6. වී. ආර්. සුරංජිත් ප්‍රේමබන්දු - අඹතැන්න හේන |
| | 7. ගාමිණී පද්මරාජ් බණ්ඩාර - අඹතැන්න හේන |
| | 8. කේ. ඒ. කීර්ති අබේනායක - අඹතැන්න හේන |



03. කුරුඹාපිටිය බෝගහමුල පාර
දිග : මීටර් 171
පළල : මීටර් 2.5

| පාරේ වම් පස | පාරේ දකුණු පස |
|---|---|
| 1. එම්. කේ. සුනිල් විජයරත්න - ජයසිංහගේ වත්ත | 1. පුංචිරාල - ජයසිංහගේ වත්ත |
| 2. එම්. කේ. කුමාර - ජයසිංහගේ වත්ත | 2. වී. අල්ලිසා - ගලඋඩහේන දැනට වත්ත |




සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
පරණකූරු කෝරළේ කඳුඅග පත්තුවේ කුරුම්බාපිටිය ගමේ පිහිටි
[illegible] වත්ත
නැමැති ඉඩම මැන සාදන ලද කැබලි 18 ක
පිඹුර

මායිම් ඉංගිත සඳහන් පරිදි වේ.

| කැබලි අංකය | ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | ප |
| 1 | 0.02087 | 0 | 0 | 08.25 |
| 2 | 0.06025 | 0 | 0 | 23.82 |
| 3 | 0.01850 | 0 | 0 | 07.31 |
| 4 | 0.18550 | 0 | 1 | 33.34 |
| 5 | 0.05950 | 0 | 0 | 23.52 |
| 6 | 0.00820 | 0 | 0 | 03.24 |
| 7 | 0.01940 | 0 | 0 | 07.67 |
| 8 | 0.00475 | 0 | 0 | 01.88 |
| 9 | 0.05250 | 0 | 0 | 20.76 |
| 10 | 0.02570 | 0 | 0 | 10.16 |
| 11 | 0.05450 | 0 | 0 | 21.55 |
| 12 | 0.06125 | 0 | 0 | 24.22 |
| 13 | 0.07620 | 0 | 0 | 30.13 |
| 14 | 0.02050 | 0 | 0 | 08.10 |
| 15 | 0.08950 | 0 | 0 | 35.38 |
| 16 | 0.03075 | 0 | 0 | 12.16 |
| 17 | 0.02900 | 0 | 0 | 11.47 |
| 18 | 0.00675 | 0 | 0 | 02.67 |
| එකතුව | 0.82362 | 2 | 0 | 05.68 |

මනින ලද දිනය : 2007-07-01

04. අඹවල සමගි මාවත
දිග : මීටර් 500
පළල : මීටර් 2.5


පාරේ වම් පස

1. බී. වී. ආර්. බෝගල - හිටිනාවත්ත
2. ආර්. ඒ. මාලිනී රණබාහු - හිටිනාවත්ත
3. ඒ. පියුමි මංජුලා සෙනෙවිරත්න - හිටිනාවත්ත
4. එච්. ආර්. පොඩිමැණිකේ - හිටිනාවත්ත
5. එස්. ආර්. ආරියපාල - හිටිනාවත්ත
6. ජී. ආර්. විමලදාස - හිටිනාවත්ත
7. ඒ. සුබරත්න බණ්ඩා - හිටිනාවත්ත

පාරේ දකුණු පස

1. ඒ. අශෝකා ප්‍රියන්ති ලාල් - හිටිනාවත්ත
2. ජී. ආර්. සුරේෂ් නිශාන්ත ගමගේ - හිටිනාවත්ත

බලයලත් මිනින්දෝරු
තඩු අංකය:-




පරිමාණය:- අඟලට දම්වැල් 2 යි

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
පරණකූරු කෝරළේ මාවත පත්තුවේ
අඹවල ගමේ හිටිනාවත්ත නමැති ඉඩමේ

පිඹුර

මායිම්:

උතුරට :-
නැගෙනහිරට :-
දකුණට :-
බස්නාහිරට :-

ඉහත සඳහන් පරිදි

බිම් ප්‍රමාණය:-

| කැබලි අංකය | අ. | රූ. | ප. | හෙක්ටාර් | සොයාවස | විස්තරය පැවිදි අය |
|---|---|---|---|---|---|---|
| 1. | 0. | 1. | 06.3 | 0.1184 | | ඒ. බිංගිරිමහත්තයා |
| 2. | 0. | 2. | 12.6 | 0.2367 | | ඒ. පිංචිඅප්පුහාමි |
| 3. | 0. | 0. | 02.4 | 0.0061 | | ප්‍රවේශ මාර්ගය පොදුවේ. |
| 4. | 0. | 1. | 02.6 | 0.1077 | | එස්. ආර්. පියසේන |
| 5. | 0. | 1. | 02.6 | 0.1077 | | ජී. ආර්. විමලදාස. |
| 6. | 0. | 0. | 01.4 | 0.0035 | | ප්‍රවේශ මාර්ගය පොදුවේ. |
| 7. | 0. | 2. | 05.2 | 0.2155 | | ඒ. සුබරත් බණ්ඩා |
| 8 | 0. | 0. | 16.0 | 0.0405 | | ප්‍රවේශ මාර්ගය පොදුවේ |
| එකතුව | 2 | 0 | 09.1 | 0.8364 | | |

මැනීම කල දිනය:- 1995.06.21
බෙදීම කල දිනය:- 1995.07.27.

බලයලත් මිනින්දෝරු
1996.04.22

09-108

## කෑගල්ල නගර සභාව

### 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින් එහි නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2014 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරුද්ධතාවයට හේතුව ලියවිල්ලකින් දන්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජී. කේ. සමරසිංහ,
සභාපති,
නගර සභාව - කෑගල්ල.

2013 අගෝස්තු මස 14 වැනි දින,
කෑගල්ල නරග සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජශාලාවේ සභාපති/ලේකම් ද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| මෛත්‍රී අතුරුපාන, අංක 343/7, රංවල, කෑගල්ල | ලේකම් | කෑගල්ල වැව්ලිකරුවන්ගේ සමාජය | අංක 39, ස්වර්ණ ජයන්ති මාවත, කෑගල්ල |

09-45/1

---

## කෑගල්ල නගර සභාව

### 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් තැනැත්තා විසින් එහි නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2014 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරුද්ධතාවයට හේතුව ලියවිල්ලකින් දන්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජී. කේ. සමරසිංහ,
සභාපති,
නගර සභාව - කෑගල්ල.

2013 අගෝස්තු 14 වැනි දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපති/ලේකම් ද යන වග* | *සමාජ ශාලාවේ නම* | *සමාජ ශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය/පවත්වන ස්ථානය* |
|---|---|---|---|
| විදාන හේනයලාගේ සිරිල් අංක 167/28 ඔලගම, කෑගල්ල. | සභාපති | බිලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් | අංක : 152 කළුගල්ල මාවත, කෑගල්ල. |

09-45/2

**මහරගම නගර සභාව**

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 50 හා 52 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2013 අගෝස්තු මස 02 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| පාරේ නම | විස්තරය | දිග අඩි | පළල | ආරම්භය | අවසානය |
|---|---|---|---|---|---|
| පතිරගොඩ මායා මාවත වරිපනම් අංක : 15/1 සිට අංක 21 දක්වා වූ මාර්ගය | ඩී. ඩබ්. අබේසිංහ මිනින්දෝරු තැන විසින් 1983.02.17 වැනි දින මැන සකස් කරන ලද 1125 අංක දරන මිනින්දෝරු සැලැස්මට අනුව | 156 | මිනින්දෝරු සැලැස්මට අනුව | 15 | 15/3 |
| පතිරගොඩ විහාරවත්ත පාර වරිපනම් අංක : 25, 23 අතර සිට 23/7 දක්වා අතුරු මාර්ගය | | 432 | 12 | 23,25 | 23/7 |
| ලියනගොඩ ග්‍රාම නිලධාරී වසමේ උද්‍යාන පාර අසල අංක : 1164/2 නිවස අසලින් ඇති අතුරු මාර්ගය | ආර්. ඒ. සිරිසේන මිනින්දෝරු තැන විසින් 2011.02.08 වැනි දින මැන සකස් කරන ලද අංක : 2010 දරන මිනින්දෝරු සැලැස්මට අනුව | 246 | 10 | 429 | 427/6 |
| කොට්ටාව කුල සෙවණ පාරේ වරිපනම් අංක 66/24 අසලින් ඇති අතුරු මාර්ගය | ඩී. ඩබ්. අබේසිංහ මිනින්දෝරු තැන විසින් 1983.02.15 වැනි දින මැන සකස් කරන ලද 1125 අංක දරන මිනින්දෝරු සැලැස්මට අනුව | 470m | 3.0m | 66/24 | 66/27 |
| කොට්ටාව කුලසෙවන පාරේ වරිපනම් අංක 66/32 අසලින් ඇති අතුරු මාර්ගය | | 465m | 3.0m | 66/32 | 66/31 |

09-21

# විවිධ දැන්වීම්

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින්, 252 වැනි අධිකාරියේ iv වැනි කොටසින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරනු වස් සම්මත අතුරු ව්‍යවස්ථාවේ x කොටසේ 19 සහ 20 වගන්ති සහ xi කොටසේ විධිවිධාන පරිදි 2013.07.23 වැනි දින පැවති මුදල් කමිටුවේ අංක 73:19 සහ 2013.07.29 වැනි දින පැවති මහා සභාවේ අංක 06:01 තීරණ අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ව්‍යාපාරික ස්ථානවලින් 2013 ජුනි මස 01 වැනි දින සිට ගාස්තු අය කිරීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි සියලුම වාණිජ/කර්මාන්ත/හෝටල් ආපනශාලා සහ සාත්තු නිවාසවල පහත දැක්වෙන ආකාරයට ගාස්තු අය කිරීම් සිදු කරනු ඇත.

භාවිත ගාස්තු 1

| *පරිශ්‍රය* | *මාසික ගාස්තු ප්‍රමාණය* |
|---|---|
| *වාණිජ :* | *රු. ශත* |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 ට අඩු | 200 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200- 1000 දක්වා | 750 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 1000 - 3000 දක්වා | 1000 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 3000 ට වැඩි | 1500 |
| *කාර්මික :* | |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 ට අඩු | 200 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 - 1000 ක්වා | 750 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 1000 - 3000 දක්වා | 1000 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 3000 ට වැඩි | 2000 |
| *හෝටල් ආපනශාලා සාත්තු නිවාස :* | |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 ට අඩු | 200 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 200 -1000 දක්වා | 750 |
| වර්ග ප්‍රමාණය වර්ග 1000 - 3000 දක්වා | 2000 |
| වර්ග ප්‍රමාණය වර්ග අඩි 3000 ට වැඩි | 5,000 |
| ආගමික ස්ථාන, රජයේ රෝහල් සහ රජයේ ආයතන (ලාභ ලැබීම ඉලක්ක කොට නොගත්) | ගාස්තු අය නොකෙරේ. |

***භාවිත ගාස්තු (තොග අපද්‍රව්‍ය) :***

තොග වශයෙන් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ව්‍යාපාරික ස්ථානවලින් ගෙවිය යුතු ගාස්තු පහත දැක්වෙන පරිදි වේ. :-

| | *අපද්‍රව්‍ය ප්‍රමාණය* | *එක්වරකට ගෙවිය යුතු ගාස්තුව (රුපියල්)* |
|---|---|---|
| *(අ)* | අත් කරත්තයකට අඩු ප්‍රමාණය (කියුබික් මීටර් 0.25) | ගාස්තු රහිතයි |
| *(ආ)* | ට්‍රැක්ටර් 1/2ක ප්‍රමාණය සඳහා | 500 |
| *(ඇ)* | පිරුණු ට්‍රැක්ටරයක ප්‍රමාණය | 1000 |
| *(ඈ)* | ට්‍රැක්ටරයක ප්‍රමාණය ඉක්මවූ විට | *ආ සහ ඇ වල ගුණිතය* |

* ගාස්තු නොගෙවන ව්‍යාපාරික ස්ථානවලින් කසළ එකතු කිරීම සිදු නොකරනු ඇත.
* ගාස්තු සඳහා වන ඉහත විධාන සම්බන්ධයෙන් කෙරෙන සෑම කඩ කිරීමක් සඳහාම දඩ මුදලකට යටත් වනු ඇත.
* මාසිකව ගාස්තු ගෙවිය යුතු අතර, සෑම මසක් සඳහාම ඊට පෙර මාසයේ 25-30 අතර, දිනක ගාස්තු ගෙවිය යුතු අතර, ගෙවීම් සඳහා මහා නගර සභාව මගින් බිල්පත් නිකුත් කෙරෙනු ඇත.
* වර්ෂය සඳහා ගෙවිය යුතු වන සම්පූර්ණ ගාස්තු එකවර ගෙවීමට හැකිය.
* ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව නමින් ලියන ලද චෙක්පත් මගින්ද ගෙවීම් කළ හැකිය.

ආර්. ඒ. ඩී. ජනක රණවක,
නගරාධිපති,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව.

09-83

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | |
|---|---|---|
| | *රු.* | *ශ.* |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතුය.

14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමලේඛනය)... ... | 780 00 | 1,250 00 |
| අති විශේෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිලදී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| සැප්තැම්බර් | 2013.09.06 | සිකුරාදා | 2013.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.13 | සිකුරාදා | 2013.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.20 | සිකුරාදා | 2013.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.27 | සිකුරාදා | 2013.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ඔක්තෝබර් | 2013.10.04 | සිකුරාදා | 2013.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.11 | සිකුරාදා | 2013.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.17 | බ්‍රහස්පතින්දා | 2013.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.10.25 | සිකුරාදා | 2013.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2013.11.01 | සිකුරාදා | 2013.10.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.11.08 | සිකුරාදා | 2013.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.15 | සිකුරාදා | 2013.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.22 | සිකුරාදා | 2013.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.11.29 | සිකුරාදා | 2013.11.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.